# A source-based study of early Buddhist interpretation and usage of mind

## මනස පිළිබඳ ආදි බෞද්ධ අර්ථ විග්‍රහය හා භාවිතාව පිළිබඳ මූලාශ්‍රයගත අධ්‍යයනයක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

ආදි බුදුසමයෙහි චිත්ත, විඤ්ඤාණ යන පදයන් හා පර්යාය වූ අනෙක් පදය නම් "මනො" යන්නයි. මෙය සිතීම, හැඟීම යන අරුත් ඇති "මන්" ධාතුවෙන් නිපන් පදයකි. කර්මයන් සිදුකිරීම මනස මගින් ද සිදු වේ. චූල්ලකම්ම විභංග සූත්‍රයේ එය "චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා" යනුවෙන් දක්වා ඇත. ඒ අනුව මනෝ යන පදය බුදුසමය තුළ යෙදී ඇත්තේ සිත නැමැති පුළුල් ක්‍රියාකාරී ධාතුව හැඳින්වීමේ දී එහි එක්තරා ක්‍රියාකාරී ලක්ෂණයන් නිරූපණය කිරීම සඳහාය. වඩාත් ප්‍රකට ලෙස මනෝ යන්න විග්‍රහ කරනවිට සිත නැමැති ඉන්ද්‍රිය හැඳින්වීමට එය යොදා ඇත. ම.නි. මහාතණ්හාසංඛය සූත්‍රය තුළ ඉන්ද්‍රිය හයක් ඒවාට අනුරූප වූ ආයතන හයක් මෙන්ම ඒ තුළින් නිර්මාණය වන්නා වූ විඤ්ඤාණ හයක් දක්වා ඇත.[1]

| | | | | |
|---|---|---|---|---|
| චක්ඛු | → | රූප | → | චක්ඛු විඤ්ඤාණය |
| සෝත | → | ශබ්ද | → | සොත විඤ්ඤාණය |
| ඝාණ | → | ගන්ධ | → | ඝාණ විඤ්ඤාණය |
| ජිව්හා | → | රස | → | ජිව්හා විඤ්ඤාණය |
| කාය | → | ස්පර්ශ | → | කාය විඤ්ඤාණය |
| මන | → | ධර්ම | → | මනො විඤ්ඤාණය |

මෙහි දී මනස හා ධර්ම එකතුවෙන් මනෝ විඤ්ඤාණය නිර්මාණය වන බව දක්වා ඇත.[2] එසේම චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය යන ඉන්ද්‍රියන් සංඛ්‍යාවට "මන" යන්නද ඉන්ද්‍රියක් ලෙස එකතු කොට ඇත. එහි "චිත්ත" හෝ "විඤ්ඤාණ" පදයන් කිසිවිටෙක යෙදී

---

[1] යඤ්ඤදෙව භික්ඛවෙ පච්චයං පටිච්ච උප්පජ්ජති විඤ්ඤාණං තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති. චක්ඛුඤ්ච පටිච්ච රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණොව සඞ්ඛං ගච්ඡති. සොතං ච පටිච්ච සද්දෙච උප්පජ්ජති විඤ්ඤාණං සොතවිඤ්ඤාණොව සඞ්ඛං ගච්ඡති. ඝාණං ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති විඤ්ඤාණං ඝාණවිඤ්ඤාණොව සඞ්ඛං ගච්ඡති. ජිව්හඤ්ච පටිච්ච රසෙච උප්පජ්ජති විඤ්ඤාණං ජිව්හා විඤ්ඤානොව සඞ්ඛං ගච්ඡති. මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති විඤ්ඤාණං මනොවිඤ්ඤානොව සඞ්ඛං ගච්ඡති.
**ම.නි. I, මහාතණ්හා සංඛය සූත්‍රය, බු.ජ.මු., පි. 460**

[2] මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති විඤ්ඤාණං මනොවිඤ්ඤාණොව සඞ්ඛං ගච්ඡති.
**ම.නි. I, මහා තණ්හා සංඛය සූත්‍රය, බු.ජ.මු., පි.460**

නොමැත. එයට හේතුව ලෙස දැක්වෙන්නේ ඉන්‍ද්‍රියාර්ථය නියෝජනය වනුයේ "මන" යන පදය තුළින් පමණක් බැවිනි. මනස නැමැති ඉන්‍ද්‍රිය කරණකොටගෙන ඊට අදාල ගෝචර වස්තුව ප්‍රජානනය කරනු ලබයි. එසේම මේ තුළින් මනෝ යන්න මධ්‍යස්ථාන අර්ථයෙන් ද යෙදී ඇති අයුරු දැකගත හැකිවේ. "ධම්මං මනසා අනුපෙක්ඛති"[3] (මනසින් දහම විනිවිද දකී) යන තැනදී පවා දහම තේරුම් ගැනීමට භාවිත කොට ඇති මධ්‍යස්ථානය වන්නේ මනෝ ඉන්‍ද්‍රියයි. සුත්ත නිපාතයෙහි දැක්වෙන අන්දමට "මනසා දිට්ඨී ගතානි චින්තයන්තො"[4] දෘෂ්ටීන් පිළිබඳ සිතන්නේ මනස නැමැති ඉන්‍ද්‍රිය කරණකොටගෙනය. එසේම "කාය සංඛාර" යනුවෙන් කයින් සිදුකරනු ලබන කර්ම පිළිබඳ අර්ථවත් කරන්නා සේම "මනෝ සංඛාර" යනු මනස මූලිකව සිදුකරන්නා වූ මානසික ක්‍රියාකාරකම්ය.

"මන" යන පදය පිළිබඳ පැහැදලි අදහසක් ලබාගැනීම සඳහා අට්ඨකතාචාර්යවරුන්ගේ අදහස් විමසාබැලීම මෙහි දී ඉතා වැදගත් වේ. එම දේශනාවන්ට අනුව මනස යනුවෙන් විග්‍රහවන්නේ භවංග චිත්තයයි. "මනන්ති භවංග චිත්තං"[5] මෙය විචාර පූර්වකව කරන ලද විග්‍රහයක් ලෙස බොහෝ උගතුන් පිළිගන්නේ නැත. "මනෝ" යන්න භවංග චිත්තය ලෙසට ගත්විට සිතුවිලි පහලවීමේ දී එය ක්‍රියාකාරීත්වයට පත්වන්නේ කෙසේද? යන ගැටළුව නිර්මාණය වේ. එම නිසා චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මනෝ යන මෙම ඉන්‍ද්‍රියන් අජ්ඣත්තික ආයතන ලෙසට තෝරාගැනීම ඉතාම යෝග්‍ය වේ. මහාචාර්ය එම්. විජේසේකර මහතා දක්වන්නේ "මනෝ" යන්න යාන්ත්‍රික ක්‍රියාවලියක අර්ථය ගෙනදෙන බවත්, චිත්ත යන්න භවංග ක්‍රියාවලියක අර්ථය ගෙනදෙන බවත්, විඤ්ඤාණ යන්න ප්‍රජානන ක්‍රියාවලිය නියෝජනය කරන බවත්ය. මහාචාර්ය විජේසේකර මහතාගේ මෙම විග්‍රහය තුළින් ද පෙනෙන්නේ මනෝ යන්න යාන්ත්‍රික ලක්ෂණ පෙන්වන බවයි. මෙම අදහස තවදුරටත් තහවුරු කරන තවත් ප්‍රකාශයක් හත්ථිපදෝපම සූත්‍රයේ දැක්වේ.[6] ඉදින් ආධ්‍යාත්මික වූ මනෝ නොබිඳුනේ වේද, බාහිර ධර්මයෝ ආපාතයට පැමිණේ. එහෙත් "අනුරූපී වූ මෙනෙහි කිරීමක් නොවේ නම් ඒතාක් ඊට අනුරූපී වූ විඤ්ඤාණභාගයාගේ පහළවීමක් නොවේ." මෙම ප්‍රකාශයේදී පෙන්නුම් කරන කරුණු කීපයක් වේ. එනම් විඤ්ඤාණ භාගයාගේ පහලවීම සඳහා පදනම් වන්නා වූ ප්‍රධාන සාධක 03ක් ඇති බවයි.

01. මනසේ අපරිභින්නභාවය නොහොත් නොබිඳුණු බව

02. බාහිර ධර්මයන්ගේ පැමිණීම

03. අදාළ මෙනෙහි කිරීම

---

[3] **දී.නි. III, බු.ජ.මු., 242 පිට.**

[4] **ඛු.නි., සුත්තනිපාතපාළි, අට්ඨක වග්ග, පසූර සුත්තං**

[5] **ම.නි., මූලපණ්ණාස අට්ඨකථා, සීහනාද වග්ග, මධුපිණ්ඩිකසුත්ත වණ්ණනා**

[6] අජ්ඣත්තිකො තෙ ආවුසො මනො අපරිභින්නං හොති. බාහිරා ච ධම්මා ආපාතං ආගච්ඡන්ති. නො ච තජ්ජොව සමන්නාහාරො හොති. නෙවතාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති.
**ම.නි., මූලපණ්ණාසපාළි, ඔපම්ම වග්ග, මහාහත්ථිපදොපම සුත්ත**

මෙම ප්‍රකාශනයෙන් ඉතාම සියුම්ව ප්‍රකටකොට ඇත්තේ මනස ඉන්ද්‍රියක් ලෙසට ගැනීමේදී එය "මනෝ" වචනය භාවිතයෙන් අර්ථවත් කොට ඇති බවයි. විඤ්ඤාණ භාගයාගේ ඇතිවීම සඳහා "මනෝ" යන ඉන්ද්‍රියයගේ නොබිඳුණු, නොකැඩුණු තත්ත්වය ප්‍රධාන වූ සාධකයක් ලෙසට පවතින බව මෙහි දක්වා ඇත. මීට සමගාමීව තවත් ප්‍රකාශයක් අං.නි තුළින් සොයාගත හැක.[7] "මහණෙනි, අකුසල වූ අකුසල කොටසට වැටෙන, එම පක්ෂයට යොමු වූ යම් ධර්මයක් වේද, එය මනෝ පූර්වාංගම කොට ඇත. එම ධර්මයන්ට ප්‍රථම මනො උපදියි. ඒහා එක්ව අකුසල ධර්ම හටගනී." මෙම ප්‍රකාශය තුළද පෙන්නුම් කොට ඇත්තේ අකුසල පක්ෂයට අයත් සියලු සිතුවිලි මනෝ යන ඉන්ද්‍රිය ප්‍රත්‍යකොට ගෙන පවතින බවයි. මනෝ ආයතනය, මනො ධාතුව යන ධර්ම ස්වභාවය මේ තුළින් දැක්වේ.

මීට අමරව "මනො" යන්න ස්ථිතියක් ලෙස ද ක්‍රියාත්මක වෙ. මෙය ස්ථිතියක් ලෙස හැඳින්වුව ද එය නිත්‍ය අවිපරිණාමී, ශාස්වත ලක්ෂණයන්ගෙන් යුතු ධාතුවක් ලෙස නොසැළකිය යුතු වේ. "මනෝ" යන්න ස්ථිතියක් ලෙස ගත හැක්කේ එය සිතුවිලි සඳහා උපකරණයක් ලෙසට ඒ ඒ අවස්ථා තුළ දී භවාංග සිතින් බැහැරව තත් වූ පරිද්දෙන් විෂය ගෝචරව ඇතිවන නිසාය. මින් අදහස් වන්නේ ව්‍යුහාත්මක පදනමක් ඒ තුළින් නිර්මාණය වන බවයි. මනො යන්නෙහි ක්‍රියාකාරී ලක්ෂණය හඳුනාගැනීම මෙහිදී වැදගත් වේ. "මනො" යන්න ආයතනයක් මෙන්ම ගබඩාවක් ලෙස ද පැහැදිලි වේ. අනෙකුත් ඉන්ද්‍රියන්ගෙන් ලබන සියලු ඉන්ද්‍රියාර්ථ ඒකරාශී කරගැනීමේ හැකියාවක් මනෝ ධාතුව තුළ ඇත. "ඇවැත්නි විෂය විසින් වෙන්ව සිටි ගෝචර වශයෙන් වෙන්ව සිටි ඒ ඒ ඉන්ද්‍රියන්ගේ ගෝචර විෂය නොවිඳින පඤ්ච ඉන්ද්‍රියන්ගේ පිළිසරණ මනස නම් වේ. මනස ඔවුන්ගේ ගෝචර විෂය විඳී"[8] මෙම විග්‍රයෙන් පෙනී යන්නේ අනෙකුත් ඉන්ද්‍රියන්ට අවශේෂ ඉන්ද්‍රියන්ගේ ප්‍රත්‍ය දැනගැනීමට ශක්‍යතාවයක් නොමැති වුව ද මනස සියලු ඉන්ද්‍රියන්ගෙන් ලබන දත්ත වෙන් වෙන්ව හඳුනාගැනීමටත් වෙන් වෙන්ව ප්‍රදර්ශනය කිරීමටත් ශක්තිය ඇති බවයි.

මනසේ තවත් ක්‍රියාකාරීත්වයක් ලෙස හඳුන්වා දී ඇත්තේ අරමුණු පිළිගැනීමේ ක්‍රියාකාරීත්වයයි. රුවෝ ජොහැන්සන් මහතා "මනො" යන්නෙහි ක්‍රියාකාරීත්වය දෙයාකාර බව දක්වයි. මෙයට හේතුව ලෙස ඔහු දක්වන්නේ මනස ආධ්‍යාත්මික සිතුවිලි සඳහා වූ ම්‍යස්ථානයක් ලෙසට ද ක්‍රියාකාරී වන බැවිනි. අරමුණු පිළිගැනීම හා අනෙකුත් ඉන්ද්‍රිය දත්තවල සෘජු අත්දැකීම් බුදුසමයට අනුව සෑම ඉන්ද්‍රිය හා ඉන්ද්‍රියාර්ථ සංඝට්ඨනයෙන්ම එයට ලබාදෙයි. හුදෙක් එය ස්වීය අද්දැකීමකි. සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ, ලෙස ද දැක්විය හැක. මේ නිසා සෑම සංඥාවක්ම වේදනාවක්ම මනෝපචාර ලෙසට හඳුන්වා දිය හැකිබව ජොහැන්සන් දක්වයි.

---

[7] යෙ කෙචි භික්ඛවෙ ධම්මා අකුසලා, අකුසල භාගියා, අකුසල පක්ඛිකා, සබ්බෙ තෙ මනො පුබ්බංගමා මනො තෙසං ධම්මානං පඨමං උප්පජ්ජති අන්වදෙව අකුසලා ධම්මා
**අං.නි., එකක නිපාත, අච්ඡරාසඞ්ගාත වග්ග**

[8] ඉමෙසං ඛො ආවුසො පඤ්චන්නං ඉන්ද්‍රියානං නානාවිසයානං නානාගොචරානං න අඤ්ඤමඤ්ඤස්ස ගොචරවිසයං පච්චනුභොන්තානං මනො පටිසරණං කො ච නෙසං ගොචරවිසයං පච්චනුභොති.
**ම.නි., මූලපණ්ණාසපාළි, චූළයමක වග්ගො, මහාවේදල්ල සුත්තං**

මනසින් ධර්ම දැක සොම්නසට කරුණු වූ ධර්ම විචාරය කෙරේ[9] යන්නෙන් දැනීමේ ක්‍රියාවලියත්, වින්දනයත් මනෝ පූර්වාංගමව සිදුවන ආකාරය මනාව පැහැදිලි වේ. මජ්ඣිම නිකායෙහි දැක්වෙන ආකාරයට "අජ්ඣත්තිකො මනො අපරිභින්නො හොති"[10] යන පාඨය තුළ ප්‍රකට කරන ප්‍රධාන ලක්ෂණය නම් සංජානන ක්‍රියාවලියේ දී වැදගත් වූ අවස්ථාන්තරයක් "මනො" යන්න නියෝජනය කරන බවයි. මෙම ක්‍රියාකරීත්වය හුදු මනො ආයතනයට පමණක් සීමා නොකර ඒ තුළින් ඇතිවන විවිධ අවස්ථාන්තරයන් සමඟ සංජානනය, සංවේදනය මේ තුළින් ප්‍රකට වේ.

මනසේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමේදී මෙනෙහි කිරීමේ හැකියාව ද මනස සතුවන බව දැක්වේ.[11] මනසිකාරය මනො ආයතනය මුල්කොටගෙන නොහොත් මධ්‍යස්ථාන කොටගෙන ඇති වන්නකි. මේ නිසාම මෙනෙහි කිරීමේ හැකියාව ද මනො ධාතුව වටා ගොඩනැගෙන මානසික තත්වයකි. පුද්ගලයා "මන" මෙනෙහි කිරීමට පැමිණ චේතො සමාධිය ස්පර්ශ කරන බව දැක්වේ.[12] මෙහිදී ද "මනො" යන්න මධ්‍යස්ථානයත් කොට ගනිමින් මෙනෙහි කිරීමේ ශක්තිය ගොඩනගන බව අවධාරණය කරයි.

සිතීම මෙන්ම බුද්ධිය ද මනො ධාතුවට සම්බන්ධ වූවකි. 'ඉක්බිතිව ඔබ තර්කයට පැමිණ මනසින් දෘෂ්ටීන් සිතන්නේය."[13] යනුවෙන් මනස මුල් කොට ගනිමින් තර්ක බුද්ධිය ආදේශ කරගනිමින් සිතනු ලබන දර්ශනවාද පිළිබඳව මෙහි ප්‍රකාශ වෙයි. මෙහිදී මනො ධාතුව බුද්ධිමය සිතීමකට සම්බන්ධව පවතින බව පෙන්වයි. මේ හා සම්බන්ධව "මනොවිතක්ක" යන වචනය ද දැක්විය හැක. විතක්ක යනු සිතුවිලිය. මනො විතක්ක යනු මනස මුල්කොටගත් සිතුවිලිය.

මනස සමඟ මනො ධාතුව ද සම්බන්ධව පවතියි. එය අනෙකුත් ඉන්ද්‍රිය දැනීමේ, ගබඩා කිරීමේ හැකියාව සමඟ ආවර්ජනය කිරීමේ හැකිකම ද පෙන්නුම් කරන්නකි. මතකය පමණක් නොව සියලු සංකල්ප හා ක්‍රියාවන්ගේ මූලස්ථානය ලෙස ද මනො ධාතුව ක්‍රියාත්මක වේ. "ඇතුළත මනසින්වත් වැරදි හැසිරීමක් නොමැත."[14] ක්‍රියාවක් ලෙසට වැරදි වැටහිම් ශරීරයෙන් නොවන්න මනස මුල්කොටගෙන හෝ සංකල්පමය වශයෙන් වැරදි හැසිරීමකට ඇතුල් නොවන බව මෙයින් පෙනේ. මෙහි කියවෙන සංකල්ප හා ක්‍රියාවන් මනො ධාතුව තුළ සිදුවන

[9] මනසා ධම්මං විඤ්ඤාය සොමනස්සට්ඨානීයං ධම්මං උපවිචරති. දොමනස්සට්ඨානීයං උපෙක්ඛට්ඨානීයං ධම්මං උපචරති.
**ම.නි., උපරිපණ්ණාසපාළි, විභඞ්ග වග්ගො, සළායතනවිභඞ්ග සුත්තං**

[10] **ම.නි., මූලපණ්ණාසපාළි, ඔපම්ම වග්ග, මහාහත්ථිපදොපම සුත්ත**

[11] සුනාථ තං මනසිකරොථ භාසිස්සාමි
**සං.නි. II බු.ජ.මු., 246 පිට**

[12] සම්මාමනසිකාරමන්වාය තථාරූපං චෙතො සමාධිං ඵුසති.
**දී.නි., සීලක්ඛන්ධ වග්ග, බ්‍රහ්මජාල සුත්ත**

[13] අථ ත්වං පබිතක්කං ආගමා මනසාදිට්ඨී චින්තයන්තො
**සු.නි. බු.ජ.මු., 834 පිට.**

[14] මනසාපිනො අතිචාරි කුතො පන කායො
**දී.නි. බු.ජ.මු., II පිට**

ක්‍රියාවක් ලෙසට දැක්වේ. "වනයට පිවිසියේ නමුත් මාගේ මනස පිටතට නික්මෙයි."[15] භාවනා කිරීම සඳහා වනයට පිවිසිය ද මනස වනයෙන් බාහිර වූ දේවල් සඳහා ගමන් කරන ආකාරය මෙයින් දැක්වේ. මෙහිදී මනස ආශ්‍රය කොටගෙන විවිධ වූ සංකල්පනා ක්‍රියාවලීන් සිදුවන බව පෙන්වයි. මෙබඳු වූ තවත් අවස්ථාවක් සුත්ත නිපාතයේ හමු වේ. එසේම ඛු.නි. ධම්මපදයෙහි චිත්ත වග්ගය තුළ ද බොහෝ නිදසුන් මේ හා සම්බන්ධව දැකගත හැකිය. "දියණු අල්ප වීර්ය ඇති මනො කය ඒ නිසාම එහි නොයයි. සංකල්ප ගමනේ එක්වන්ව යමින් මගේ මන එම බුදුන් ඇති තැන යෙදුණේ වෙයි.[16] බුදුරදුන් දුරස්ථව ජීවත් වුවත් කයින් දැකීමට නොහැකි වුවද මනෝ ධාතුව මුල් කොටගෙන සංකල්පන ක්‍රියාවන් ලෙසට බුදුන් දැකිය හැකි ලෙසින් "මන" ක්‍රියාත්මක වේ. මෙයින් සංකල්ප චිත්ත ක්‍රියාකාරීත්වය අර්ථවත් කරයි. මනඃකල්පිතව සිතේ ඇතිවන සිතුවිලි රාශිය මනො ධාතුව මුල් කොටගෙන පවතියි.

"මන" පිළිබඳ අදහස් දක්වන්නා වූ හේන්පිටගෙදර ඤාණසීහ හිමියෝ මෙය පිරිසිදු වූ අවස්ථාවක් ලෙස දක්වන අතර, චිත්ත චෛතසික මිශ්‍ර වූ අවස්ථාවක් ලෙස ද දක්වයි. "මෙම වචන භාවිතයන්ගෙන් පෙන්නුම් කොට ඇත්තේ මනො යන්න ඉන්ද්‍රියයක් ලෙසට බුදුසමය තුළ විස්තර වී ඇති බවයි. බුදුන් වහන්සේ ප්‍රායෝගික විසඳුමක් සළකා භාෂාව මෙහෙයවා ඇත. ඡබ්බිසෝදන සූත්‍රයෙහි "මුත්තං මෙ චිත්තන්ති"[17] (මගේ සිත මිදුණෙමි) යනුවෙන් දක්වන තැන්හි "මනො" යන වචනය භාවිත කොට නොමැත. ඒ වෙනුවට "චිත්ත" යන පදය යොදා ඇත. මෙහි සුවිශේෂත්වය නම් තමාගේ ක්‍රියාකාරී සිතෙන් එනම් ක්ලිෂ්ඨ තත්වයෙන් තමාගේ සිත මිදීම අර්ථවත් කිරීමට යොදා ඇත්තේ "චිත්ත" යන පදයයි. මෙහි දී "මනො" යන පදය භාවිත කළේ නම් ඉන් ප්‍රකට වන අදහස මීට වඩා වෙනස් වූ අරුතක් ගැනීමට ඉඩකඩ තිබුණි. එසේම ඇලොසියස් පීරිස් පියතුමා "මනො" යන්න ඉතා සියුම් වූ තත්වයක් ලෙසට ශබ්දාර්ථය සළකමින් දක්වා ඇත. ඔහු මෙම අවස්ථාව විස්තර කිරීමේදී, බාහිර අරමුණක් දැනගැනීමේදී භවාංග සිතේ සිදුවන ක්‍රියාකාරී වූ අවදිකම නැතිනම් චිත්තාමය අවදිකම "මනො" අර්ථයෙන් දක්වයි. ඔහු දක්වන අන්දමට එය මෙසේ නොවන්නේ නම් මනෝ අවස්ථාව බාහිර ලෝකයට මානුෂික ක්‍රියාවලියක් විවෘත වන්නා වූ ද්වාරික අවස්ථාවක් ලෙසට දැක්විය හැකි බවට අදහස් දක්වයි. තවදුරටත් අදහස් දක්වන පීරිස් පියතුමා "චිත්ත" යනු "මනො" මධ්‍යගත වූ විඤ්ඤාණය ලෙස දක්වයි. නෙත්තිප්පකරණයෙහි හා තවත් අටුවාවන්හි පරියාය වචන ලෙසට චිත්ත, මනො, විඤ්ඤාණ යෙදී ඇති අයුරු බොහෝ සෙයින් දක්වා ඇත. අභිධර්ම පිටකයේ චිත්ත, විඤ්ඤාණ යන වචන යෙදීම් විවෘත වූ මනසකින් ඒ පිළිබඳ අධ්‍යයනය කළ යුතු වේ. එහි "චිත්ත" යන්න විඤ්ඤාණ හා භවංග යන පදයන් හා යෙදී ඇත. "භවාංග චිත්ත", "භවාංග විඤ්ඤාණ" ආදි ලෙසට එය දැක්වේ. එය අචිත්ත්‍ය වූ සිත, අක්‍රිය වූ සිත ගම්‍යමාන

[15] වනං පවිට්ඨෙ අථ මෙ මනො නිච්චරති බහිත්තා
**සං.නි.I, ඛු.ජ.මු., 197**

[16] ජිනස්ස මෙ දුබ්බලස්ස - තෙනෙව කායො එලෙහි
තත්‍ථ සංකස්ස යත්‍ථාය - වජාමි නිච්චං මනොති.
**සුත්ත නිපාත. I, ඛු.ජ.මු., 144 පිට.**

[17] **ම.නි., උපරිපණ්ණාසපාළි, අනුපදවග්ගො, ඡබ්බිසොධන සුත්ත**

කරනු ලබයි. මෙහි කිසිම විටෙක "මනොභවංග' යනුවෙන් අක්‍රිය වූ සිතක් හැඳින්වීම සඳහා යොදා නොමැත. එය එසේ නොයොදා ඇත්තේ "මනො" යන අවස්ථාව තුළදී ක්‍රියාකාරී සිතකට අවශ්‍ය කරන මූලික පදනම ඒ තුළින් ඇතිවන බැවිනි.

මීට අමතරව ඩී. කලුපහන මහතා "මනො" අවස්ථාව දැකීමට අදාළ වස්තුවක් ලෙසට හඳුන්වයි. "මනො'' අවස්ථාවෙහි අනෙකුත් ඉන්‍ද්‍රියගෝචර වස්තූන් පිළිබඳ සමාලෝචනය කිරීමේ හැකියාවක් ඇතිබව අවධාරණය කරයි. ඒසේම මනො යන්නෙන් අනෙකුත් ඉන්‍ද්‍රියයන් තුළින් ලබාගත් දැනීම් ආවර්ජනය කිරීමේ හැකියාවක් ඇති බව ද ඔහු අවධාරණය කරයි. මෙය අනෙකුත් ඉන්ද්‍රියන්ට නැති ශකිත්යකි. මනො යන්නනේ එක්තරා ක්‍රියාවලියක් සිදුකරයි. එම ක්‍රියාවලියට චිත්ත, විඤ්ඤාණ සම්බන්ධ වේ. මේ නිසා දැනීම් ක්‍රියාවලිය විස්තර කිරීමේදී මනො යන්න පමණක් එකම සාධකයක් ලෙස ගැනීමට හැකියාව ඇත. අනෙකුත් ධාතූන්ගේ සමවායෙන් දැනීම් ක්‍රියාවලිය වේ. මෙහිදී "මනො" යන වචනය "ප්‍රවාහය" යන අර්ථය ගම්‍යමාන කිරීමට යෙදී නොමැත. ඒ වෙනුවට "විඤ්ඤාණය" යන්න යෙදී ඇත.[18] චිත්ත යන පදය ද ඇතැම් තැනක ගලායන අර්ථය ගම්‍යමාන කිරීම සඳහා යොදා ඇත. "චිත්ත සංඛාර", "චිත්ත සන්තති" යන පදයන්ගෙන් එය දැක්වී ඇත. නමුත් සෝකාර්ථය හැඟවීම සඳහා "මනො" යන පදය කිසිවිටෙක යෙදී නොමැත. ඇලොසියස් පීරිස් පියතුමා දක්වන ආකාරයට "මනො" යන්න භවංග සිතින් මිදුණු ද්වාරික අවස්ථාවක් නිසාම ප්‍රවාහය ගම්‍යමාන කිරීම සඳහා "මනො" යන්න යෙදී නොමැත. මෙම සියලු කරුණු විමසූ කල "මනො" යන්න යෙදී ඇත්තේ ඉන්‍ද්‍රියාර්ථය ගම්‍යමාන කිරීම සඳහා බව පැහැදිලිය.

මීට අමතරව මනස මූලික වූ ශරීරයක් හෙවත් මනෝමය කායක් පිළිබඳව ද තොරතුරු මූලික සූත්‍ර දේශනා තුළ දැක්වේ. මේ පිළිබඳ තොරතුරු දී.නි. සාමඤ්ඤඵල සූත්‍රයෙහි දැකගත හැකි අතර මනොමය අත්තපටිලාභයන් පිළිබඳ තොරතුරු පොට්ඨපාද සූත්‍රයෙහි ද මනොමය කායික දෙවිවරු පිළිබඳ අංගුත්තර නිකායේ පඤ්චම නිපාතයෙහි ද, අග්ගඤ්ඤ සූත්‍රාදියෙහි ද දැකගත හැකි වේ. තව ද බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ මනෝමය කයෙන් බඹ ලොවට වැඩම කළ බවක් මතක යැයි ආනන්ද හිමියන්ට දේශනා කොට ඇත.[19] එසේම වරක් බුදුරජාණන් වහන්සේ මනෝමය කයෙන් තමන් වෙත වැඩම කළ බව අනුරුද්ධ හිමියන් විසින් කරන ලද ප්‍රකාශයක් තුළ සඳහන් වේ.[20] එසේම මනසින් දැකිය හැකි බව ද, මනසින් ප්‍රශ්න නැගිය හැකි බව ද සුත්ත නිපාතය තුළ දැක්වේ.

---

[18] අබ්බොච්ඡින්නං විඤ්ඤාණසොතං
**දී.නි., පාථිකවග්ග, සම්පසාදනීය සුත්ත**

[19] අභිජානාමි ඛො අහං ආනන්ද ඉද්ධියා මනොමයෙන කායෙන බ්‍රහ්මලොකං උපසඞ්කමිත්වා
**සං.නි., මහා වග්ග, ඉද්ධිපාද සංයුක්තය, අයොගුළ සුත්ත**

[20] මම සඞ්කප්පමඤ්ඤාය - සත්ථා ලොකෙ අනුත්තරො
මනොමයෙන කායෙන - ඉද්ධියා උපසංකමි.
**අං.නි., අට්ඨක නිපාතය, ගහපති වග්ග, අනුරුද්ධමහාවිතක්ක සුත්ත**

මීට අමතරව විශේෂයෙන් ම.නි. මහා සකුළුදායි සූත්‍රය පිළිබඳ විමසීමේදී පුද්ගලයා තුළ පවත්නා මනෝමය කයක් පිළිබඳව පැහැදලි සඳහනක් සොයගෙත හැක. "තවද උදායි මා විසින් මෙබඳු වූ ප්‍රතිපදාවක් කියාදෙන ලදී. එනම් මාගේ ශ්‍රාවකයන් මෙම ශරීරයෙන් වෙනත් මනෝමය වූ එහෙත් රූපයෙන් යුක්ත වූ ශරීර අවයවයන්ගෙන් යුක්ත වූ ඇස් කන් ආදි වූ ඉන්ද්‍රියයන් ක්‍රියාත්මකව පවත්නා ශරීරයක් නිර්මාණය කරන බවයි. එනම් මුදුතණ ගසකින් ගොබයක් එළියට අදින්නාක් මෙනි. එසේ ගලවා බලන්නෙකුට මේ තෘණ ගසය, මේ ගොබය යැයි කියාද, තෘණ ගස වෙනමය, ගොබය වෙනමය කියා ද වැටහෙන්නේය. මේ තණ ගසින්ම මේ ගොබය එළියට ගන්නා ලද්දේය කියා වැටහෙන්නේය. තවද යමෙකු කඩුවක් කොපුවෙන් එළියට ඇද පසුව මෙය කඩුවය මේ කොපුවය කඩුව අනෙකකි. කොපුවෙන්ම කඩුව එළියට ගන්නා ලද්දේය කියා ද වැටහෙන්නේය. එම්බා උදායි යම් සේ පුරුෂයෙක් සර්පයෙකු පෙට්ටියෙන් එළියට ගනී. ඒ පුරුෂයාට මේ සර්පයාය. මේ පෙට්ටියය. නයා අනෙකකි. පෙට්ටිය අනෙකකි. පෙට්ටියෙන්ම නයා එළියට ගන්නා ලද්දේය කියා වැටහෙයි. එම්බා උදායි, යම් සේ ක්‍රියා කිරීමෙන් මාගේ ශ්‍රාවකයෝ මේ ශරීරයෙන් රූපයෙන් යුක්ත වූ මනෝමය වූ සියුම් වූ සියලු ලොකු කුඩා අඟ පසඟින් යුක්ත වූ සියලු ඉන්ද්‍රියන්ගෙන් සම්පූර්ණ වූ වෙනත් ශරීරයක් එළියට ගන්නේය. ඒ ප්‍රතිපදාව මා විසින් කියා දෙන ලදි.[21] උක්ත ලක්ෂණයන්ගෙන් විග්‍රහ කරන ලද්දා වූ "මනො" යන්න පිළිබඳ ද ආදි බුදුසමයේ පොදු ලක්ෂණයක් කෙලවර දක්වා ඇත. එනම් එය ද අනිත්‍යතා ලක්ෂණයෙන් යුක්ත බවයි.[22] මෙසේ ආදි බෞද්ධ අධ්‍යයනයන් තුළින් "මන" පදයෙහි පර්යාය ලක්‍ෂණයන් මෙන්ම විවිධාර්ථයන් ද දැකිය හැක.

---

[21] **ම.නි., බු.ත්‍රි.ග්‍ර.මා. II, පිට 358.**

[22] මනො අනිච්චො විපරිණාමි අඤ්ඤථාභාවි.
**සං.නි., ඛන්ධ වග්ග, ඔක්කන්තසංයුක්තය, චක්ඛු සුත්ත**